## පළමුවන කියැවීම

ජෙරමියා 31:7-9

ජෙරමියා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"මම අන්ධයන් සහ කොරුන් සනසමින් ආපසු ගෙනෙන්නෙමි."**

සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක. "ජාතින් අතරේ අගතැන්පත් ඉශ්රායෙල් ගැන ප්‍රීතියෙන් ගී ගයන්න. 'සමිඳාණෝ සිය සෙනග ගැලවූ සේක. ඉතිරි ව සිටින සෙනග මුදා ගත් සේක.' කියමින් හඬ නගා පැසසුම් ගී ගයමින් ප්‍රශංසා කරන්න. බලන්න, උතුරු දේශයෙන් මම ඔවුන් ගෙනෙන්නෙමි. පොළොවේ ඉතා දුර තැන්වලින් ඔවුන් රැස් කරන්නෙමි. අන්ධයන් සහ කොරුන් ද ගර්භණීන් හා ප්‍රසව වේදනාව විඳින කාන්තාවන් ද ඔවුන් සමග පැමිණෙනු ඇත. ඔවුන් මහත් සමූහයක්ව හැරී එනු ඇත. ඔවුන් අඬමින් ද කන්නලව් කරමින් ද ගිය නමුත්, මම ඔවුන් සනසමින් ආපසු ගෙනෙන්නෙමි. දිය ඔයවල් අසලත් නොපැකිළෙන, ඇද නැති මාවත් ඔස්සේ ඔවුන් ගෙන යන්නෙමි. මම ඉශ්රායෙල්වරුන්ගේ පියා වෙමි. ඒප්‍රායිම් මාගේ කුළුඳුල් පුත්‍රයා වන්නේ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 126:1-6

පිළිතුර: සමිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක.

ගීය: සමිඳුන් අප මුදා සියොනට ගෙනා කල, අපට එය සිහිනයක් මෙන් විය. එවිට අපි සිනාවෙන් ඉපිලී ගියෙමු. ප්‍රීතියෙන් ගී ගායනා කළෙමු. එවිට, "සමිඳාණෝ මොවුන් උදෙසා ඉමහත් දේ කළ සේකැ"යි විජාතීහු කියන්නට ගත්හ.

සමිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක. එබැවින් අපි සන්තෝෂ වෙමු. සමිඳුනි, අපේ සිරකරුවන් දකුණු දිශාවේ ගලා යන ඇළදොළ මෙන් අපට යළි ගෙන දුන මැනව.

දුකින් කෙත වපුරන්නෝ තුටින් අස්වැන්න නෙලා ගන්නෝ ය. ඔව්හු වී මළු රැගෙන කඳුළු සල සලා පිටත්ව ගිය නමුත්, තම ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් පින පිනා ආපසු ආහ.

## දෙවන කියැවීම

හෙබ්‍රෙව් 51-6

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**"මෙල්කීසදෙක්ගේ පූජක පරපුර අනුව ඔබ සදහට ම පූජකයෙක් වන්නෙහි ය."**

හැම නායක පූජකයෙක් ම, දෙවියන් වහන්සේ ඉදිරියෙහි පඬුරුත්, පාප පූජාත් ඔප්පු කරන පිණිස ද මිනිසුන්ට සේවය කරන පිණිස ද මිනිසුන් අතරෙන් තෝරා පත් කරනු ලබයි. ඔහුත් දුර්වලකම් වලට භාජනය වී සිටින බැවින් අනුවණයන් ද මුළාවන්නන් ද ගැන ඉවසිල්ලෙන් ක්‍රියා කිරීමට ඔහුට පිළිවන. ඒ දුර්වලකම් නිසා

සෙනග උදෙසා මෙන් ම තමා උදෙසාත් ඔහු විසින් පාප පූජා ඔප්පු කරනු ලැබීම අවශ්‍ය ව ඇත. තවද ආරොන් වැනි, දෙවියන් වහන්සේ විසින් කැඳවන ලද අය මිස, අන් කිසිවක් ඒ නිලය තමාට ම පවරා නොගන්නේ ය. එසේම ක්‍රිස්තුස් වහන්සේත් නායක පූජකයකු වීමේ ගෞරවය තමන් වහන්සේම පවරා නොගත් සේක. එහෙත් "ඔබ මාගේ පුත්‍රයා ය, අද මම ඔබ ජනිත කළෙමි" යි ඔවුන් වහන්සේට කී තැනන් වහන්සේ ම ඒ ගෞරවය පැවරූ සේක. එලෙස ම වෙන තැනක, "ඔබ මෙල්කීසදෙක්ගේ පූජක පරපුර අනුව සදහට ම පූජකයෙක් වන්නෙහි ය"යි ඒ තැනන් වහන්සේ වදාරන සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** ජුවාම් 8:12

ආලේලූයා! ආලේලූයා!
"ලෝකයේ ආලෝකය මම ය.
මා අනුගාමී වන්නා ජීවනයේ ආලෝකය ලබන්නේ ය"යි
ස්වාමින් වහන්සේ වදාරන සේක
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මාක් 10:46-52

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ගුරුදේවයෙනි, මට පෙනීම දුන මැනව."**

ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් හා මහා සමූහයක් ද සමඟ ජෙරිකෝවෙන් නික්ම යන තල, තිමේයස්ගේ පුත් බර්තිමේයස් නම් අන්ධ හිඟන්නෙක් පාර අද්දර වාඩි වී සිටියේ ය. "මේ වඩින්නේ නාසරෙත්හි ජේසුස් වහන්සේ ය"යි අසා, "දාවිත්ගේ පුත් ජේසුස් වහන්ස, මට අනුකම්පා කළ මැනවැ"යි ඔහු මොරගසන්නට විය. නිහඬ වන ලෙස බොහෝ දෙනෙක් ඔහුට තරවටු කළහ. එහෙත් ඔහු, "දාවිත්ගේ පුත්‍රයාණෙනි මට අනුකම්පා කළ මැනවැ"යි වැඩි වැඩියෙන් මොර ගැසී ය. ජේසුස් වහන්සේ නැවතී, "ඔහුට හඬගසන්නැ"යි වදාළ සේක. ඔව්හු අන්ධයාට හඬගසා, "ධෛර්ය ගන්න, නැඟිටින්න, එතුමාණෝ ඔබ කැඳවන සේකැ"යි කී හ. ඔහු එවිට තමාගේ සළුව ගසාදමා, පැන නැඟී ජේසුස් වහන්සේ වෙතට ආවේ ය. ජේසුස් වහන්සේ ඔහුට කතා කොට, "මා ඔබට කුමක් කර දෙනවාට ඔබ කැමැති දැ"යි ඔහුගෙන් ඇසූ සේක. "ගුරුදේවයෙනි, මට පෙනීම දුන මැනවැ"යි අන්ධයා උන් වහන්සේට කී ය. ජේසුස් වහන්සේ ද, "යන්න, ඔබේ ශ්‍රද්ධාව ඔබට සුව සම්පත ලබා දී ඇතැ"යි ඔහුට වදාළ සේක. ඒ ඇසිල්ලෙහි ම ඔහු පෙනීම ලබා මඟ දිගේ උන් වහන්සේ පසුපස්සේ ගියේ ය.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.